





ධර්මකාමී පින්වතුනි,

අද 2013 රාජ්‍ය වර්ෂයේ සැප්තැම්බර් මසට යෙදුණු බුද්ධ වර්ෂ 2557 බිනර පුර පොහෝ දිනයයි. ධර්මයට සිත යොමු කරන පින් ඇති ඔබට අද දහම් පණිවුඩයට මාතෘකා වශයෙන් ඉදිරිපත් කරන්නේ සූත්‍ර පිටකයේ අංගොත්තර සඟියේ හත්වෙනි නිපාතයට අයත් "සකකාර ගරුකාර" සූත්‍රයයි. මේ සූත්‍රයෙහි සඳහන් වන්නේ භාග්‍යවත් බුදු පියාණන් වහන්සේත් ධර්මසේනාධිපති අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහරහතන් වහන්සේත් සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසද්දී උන්වහන්සේලා අතර සිදුවුන ඉතා වැදගත් කලාතුරකින් අහන්න ලැබෙන සාකච්ඡාවක අඩංගු කරුණු හතකි.

සැරියුත් හාමුදුරුවො පෙරවරු දානෙ වැළඳීමෙන් පසු විවේකව ඵලසමාපත්ති සුවයෙන් සිටියදී මෙහෙම අදහසක් සිතට පැමිණියා. "සත්කාර ගෞරව කරමින් කවුරුන් ඇසුරු කළොත්ද අකුසල් බැහැර කිරීමටත් කුසල් වර්ධනය කිරීමටත් යමෙකුට හැකියාව ලැබෙන්නේ" මේ අදහස සිතට ආවිගස උන්වහන්සේටම මෙසේ සිතට එනව, ඒ කෙසේදයත්,

1. ශාස්තෲන් වහන්සේට යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද

2.ශ්‍රී සද්ධර්මයට යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද

3.ආර්ය මහා සංඝයා වහන්සේට යමෙක් ගරු සත්කාර කොට ඇසුරු කරයිද
4. ශික්‍ෂා පදවලට යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද

5. සමාධියට යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද

6.අප්‍රමාදයට යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද

7. දහම් පිළිසඳරෙහි යමෙක් ගරුසත්කාර කොට ඇසුරු කරයිද ඔහුට අකුසල් දුරු කිරීමටත් කුසල් වර්ධනය කිරීමටත් හැකියාව ලැබෙනවා යනුවෙනි.

මගේ මේ සිතේ ඇති වූ සුන්දර සතුටුදායක අදහස භාග්‍යවතුන් වහන්සේ ළඟට ගිහිල්ලා උන්වහන්සේට ප්‍රකාශ කරනව ඊට පස්සේ තවත් බබළාවි. සැරියුත් හාමුදුරුවන්ට මේ සිතුවිල්ල සමග රත්තරන් උපමාවක් ඒ සමඟම හිතට ආව යම්කිසි මනුස්සයෙකුට ඉතා පිරිසිදු රන් ආභරණයක් ලැබීමෙන් පසු ඔහු මේ ආභරණය රත්රන් ඔපදාන දක්ෂ ස්වර්ණකාරකයෙකු ලඟට ගෙනගොස් ඔප දම්මවා ගත හොත් තවත් බබලනවා ඔපමට්ටම් වෙනවා. ඒ වගේ මගේ සිතට පැමිණුන මේ රත්තරන් අදහස භාග්‍යවතුන් වහන්සේට පවසා ඔපවත් කරගනිමියි සිතා බුදු හිමි වෙත ගොස් සකසා වැඳ ඉහත කරුණු හත සැළ කළේය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා සාරිපුත්ත, ඉතා හොඳයි යනුවෙන් ඉහත කී කරුණු සත වඩාත් අනුමත කරමින් අගයා ප්‍රශංසා කළ සේක. එසේ වදාළ කල සාරිපුත්ත හිමියන් ස්වාමීනි ! කෙටියෙන් දක්වා අගය කළ ඒ අදහස මම විස්තර වශයෙන් මෙසේ තේරුම් ගතිමි.

ස්වාමීනි ! යමෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතිද? ධර්මය කෙරෙහි ගෞරව ඇතැයි යන්න කිසිකලෙක නොවේ. ඔහු ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැති නම් ධර්මයට කොහෙත්ම ගෞරව සත්කාර නැත්තේමය.

ස්වාමීනි ! යමෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහිද ධර්මය කෙරෙහිද ගෞරව නැතිව සංඝයා වහන්සේ කෙරෙහි ගෞරව සහිතවීම ඇතයයි කියාද කිසිකළෙක නොවේ නැත්තේමය.

ස්වාමීනි ! යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහිද, ධර්‍මයද, සංඝයා කෙරෙහිද ගෞරව නැතිව සිල්පද කෙරෙහි ද ගෞරව කිරීමක් නොවේ.

ස්වාමීනි ! යමෙක් ශාස්තෘන් වහන්සේට, ධර්‍මයට, සංඝයාට සහ සිල්පද කෙරෙහි ගෞරව නැතිව සමාධිය (සිතෙහි ඒකාග්‍රභාවය) කෙරෙහි ගෞරව සහිතව වාසය කරනවා යයි කීම කිසි කළෙක සිදු වන එකක් නොවේ සමාධියෙහිද නැත්තේමය.

ස්වාමීනි ! ඔහු ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ධර්‍මය කෙරෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාපද කෙරෙහි, සමාධිය කෙරෙහි අගෞරව කරමින් අප්‍රමාදය(කැපවීම) කෙරෙහි ගෞරව ඇතිව වාසය කිරීම තිබේ යයි කියයිද කිසිකලෙක සිදුවන එකක් නෙවී අප්‍රමාදය කෙරෙහිද ඔහු ගෞරව නැත්තේමය.

ස්වාමීනි ! ඒකාන්තයෙන් යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැතිද, ධර්‍මයෙහිද , සංඝයා කෙරෙහිද, සිල්පද සහ සමාධියෙහි , අප්‍රමාදය යන කරුණු සයෙහිම ගෞරව නැතිව වාසය කරමින් පටිසන්ථාරය (දහම් සාකච්ඡාව) කෙරෙහි ගෞරව දක්වාවි කියන කාරණය වෙන්නෙ නැහැ දහම් පිළිසඳරටද ගෞරව නැත්තේමය.

මෙසේ ඉහත දැක්වූ ගෞරව නැති වන කරුණු හත බුදුරජාණන් වහන්සේ ඉදිරියේ තහවුරු කරවා විස්තර වශයෙන් වටහා ගත් සාරිපුත්ත හාමුදුරුවෝ ඊළඟට ඉහත කී අකුසල් බැහැර කිරීමට කුසල් වර්‍ධනය කිරීමට හේතුවන කරුණු හත පිළිබඳව එකින් එක භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේදීම පවසනව.

ස්වාමීනි ! ශාස්තෘන් වහන්සේ කෙරෙහි යමෙක් ගෞරවයෙන් වාසය කරන්නේ නම් ඔහු ධර්‍මය කෙරෙහිද ගෞරව කරනවා යයි කීම ඒකාන්තයෙන්ම සිදුවෙනවා. ඔහු ධර්‍මය කෙරෙහිද ගෞරව සහිතව වාසය කිරීම සිදුවන්නක්මය.

මේ ආකාරයට ඉහත කී කරුණු හතම පිළිබඳව ගෞරව ඇති වන විදි විස්තර වශයෙන්, හේතු වශයෙන් දකිමින් තමන් වහන්සේගේ තීරණයේ නිවැරදි බව මෙනෙහි කරමින් පැවසූහ.

ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ "සාධු! සාධු!! සාරිපුත්ත. මා විසින් කෙටියෙන් අගයන ලද මේ ධර්‍මයෙහි අර්ථය තොප විස්තර වශයෙන් මෙසේ දන්නේ නම් ඉතා හොඳයි" වදාරා නැවත වරක් භාග්‍යවතුන් වහන්සේ විසින්ම

කරුණු හත සැරියුත් හාමුදුරුවෝ විස්තර වශයෙන් වටහා ගත් ආකාරය එකින් එක අකුසල් බැහැර කිරීමටත් කුසල් වැඩීමටත් හේතු නොවන සහ හේතු වන විදි පැහැදිලි කොට අනුමත කොට එසේ විස්තර වශයෙන් දැන ගත යුතු යයි අවවාද කර වදාළහ.

සූත්‍රය පිළිබඳ සරළ විස්තරය මෙතනින් අවසන්. දැන් අපි මේ සූත්‍ර දේශනාව ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇතිව අපේ ජීවිතයට ගන්නේ කෙසේද බලමු. සැරියුත් හාමුදුරුවන්ට මුලින්ම ඇතිවුනේ යමෙකුට කවුරුන් කෙරෙහි ගරු සහ සත්කාර කරමින් වෙසෙන විටද අකුසල් බැහැර කිරීම සහ කුසල් වැඩීම සිදුවෙන්නේ යන අදහසයි. සියළු බුදුවරයන් වහන්සේලාම ලෝක සත්වයා සසරින් ගලවා ගැනීමට දෙන පරම අනුශාසනාව තමයි මේ සැරියුත් හාමුදුරුවන්ටත් සිතට ආවෙ, එනම් "සබබ පාපසස අකරණං - කුසලසස උපසමපදා" යනු ඒ පරම අවවාදයයි.

අපි තෙරුවන් සරණ යාම නිරන්තරයෙන්ම සිදු කරනව. "බුදධං සරණං ගචඡාමි" මම බුදුරජාණන් වහන්සේ සරණ යමි. ඊටත් පෙර සුපුරුදු පාලි වාක්‍යයක් කියනව ඒ "නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස" එහි සරළම තේරුම නම් තමන් විසින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නමස්කාර කොට පිළිගන්නවා යන ගෞරව සම්ප්‍රයුක්ත හැඟීම ප්‍රකාශ කිරීමයි. මෙසේ සිතන කියන අපට එතැන් පටන් අපේ රජතුමා, ගුරුවරයා, මාර්ගෝපදේශකයාණන් වන්නේ බුදුරජාණන් වහන්සේමය. අපේ ඉලක්කය වන්නේ උන්වහන්සේගේ අවවාදය අඩුපාඩු නැතිව ඉටුකරමින් වාසය කරමින් අකුසල් බැහැර කරමින් කුසල් වඩමින් සිත පිරිසිදු කරමින් සසරින් මිදීම හෙවත් නිවීමට පත්වීමය. එසේ නොවන්නේනම් උන්වහන්සේට එරෙහි පිළිවෙත් අනුගමනය කරන්නෝ වෙමු.

තම තමන් විසින් මේ සූත්‍රයට අනුව තම ජීවිතය සමග මේ කරුණු හත ගලපමින් බැලීම ගිහි පැවිදි කාගේත් වගකීම සහ යුතුකම විය යුතුය. ඒ සඳහා ශාස්තෲන් වහන්සේ කෙරෙහි අපි කරන සත්කාර ගරුකාර නිවැරදිව සහ අවබෝධයෙන් යුතුව කෙරෙන්නේ නම් ඉතිරි කරුණු හය ඊට අනුව සම්පූර්ණ වන්නේමය. ඒ සඳහා නුවණින් බුදු ගුණ දකිමු දැන ගනිමු.

භාග්‍යවතුන් වහන්සේ විසින්ම තථාගතයන් වහන්සේ නමකගේ ලඟ තිබිය යුතු පැවතියාවූ අප්‍රමාණ වූ ගුණ සාගරය 09 ක් ලෙසට අපේ පහසුවට වදාරා තියෙනව. ඒ ගුණ උන්වහන්සේ ක්‍රියාකාරීත්වයෙන්ම තහවුරු කළා සහතික කළා ප්‍රතිඥා දුන්නා. ඒ ගුණ 09 හොඳින් වටහා ගත් කෙනෙකුට ඇතිවන විශ්වාසය තමයි උන්වහන්සේට ගරු කිරීමට සත්කාර කිරීමට හේතු වෙන්නෙ එනම් අවබෝධය නිසා ඇති වන ශ්‍රද්ධාවයි. එවිට ඔහු අනිවාර්යයෙන් ධර්මයටද ගරු සත්කාර කරනවාමයි. ඒ ඔහුට ප්‍රඥාව පහළ වන නිසාය. නමුත් අද සිදුවී ඇත්තේ අවබෝධයෙන් තොරවූ ශ්‍රද්ධාවෙන් තැන තැන බුදු පිළිම හැදීමේ සංඛ්‍යාත්මක රැල්ලක් පමණයි. ඊට පිළිතුරු මේ සූත්‍රයේ කියනව.

භාග්‍යවතුන් වහන්සේ වදාලේ හේතු ඵල දහමකි. ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව ඇති වන්නේ නම් එහි ඵලය වන්නේ ධර්මයටද ගෞරව ඇති වීමයි. අපි මෙය ක්‍රියාත්මක කිරීමට පළමුවෙන් හොඳින් වටහා ගත යුතුයි.

අද බුදුරජාණන් වහන්සේ ජීවමාන නැහැ. වර්ෂ 2557කට පමණ ඉහතදී පිරිනිවනට පත් වුනා. එනමුත් උන්වහන්සේ දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ මාරයා අමතා මෙසේ දක්වා තිබෙනවා. "මාරය ! මාගේ ශ්‍රාවකයින් ආකල්පයන්ගෙන් යුක්තව තම ආචාර්යවරයාගේ චතුරාර්ය සත්‍ය ලෝකයාට කියාදෙයිද, දේශනා කරයිද, පනවයිද, පිහිටුවයිද, විවරණය කරමින් හෙළි කරයිද, බෙදා දක්වයිද, ඉස්මතුකොට පුබුදුවාලයිද එතෙක් මම පිරිනිවන් නොපාමි."

එබැවින් බුදුරජාණන් වහන්සේ සැමදා ජීවමාන කරවීමේ පෙරහරෙහි මුලින්ම භික්ෂු සංඝයා වහන්සේද ඉන්පසු පිළිවෙලින් භික්ෂුණීන් වහන්සේද, උපාසක උපාසිකාවන්ද ගමන් කරනව. මේ සූත්‍රයට අනුව මාරයාට දුන් ඒ ප්‍රතිඥාව අදට අනාථ සහ සනාථ කිරීම ඇත්තේ ඉහත කී සිව් පිරිස අතේය. මේ සූත්‍රය තේරෙන තැනින් පටන් ගනිමු. ගරුකාර කිරීම සත්කාර කිරීම යනු විශ්වාසයෙන් පිළිගෙන අවබෝධයෙන් යුතුව හොඳින් ගෞරවයෙන් පැවැත්වීමට සාධක ඇතිකිරීමයි. ප්‍රධාන වශයෙන් අද අඩුපාඩු වී ඇත්තේ ධම්ම පටිසන්ථාරය හෙවත් දහම් පිළිසඳරයි සාකච්ඡාවයි. පළමුවෙන් එය අවංකවම ඕනෑකමින් ජීවමාන කරමු. එවිට අපි හැමෝම ප්‍රමාද වෙන්නේ නැහැ. ධර්මය සාකච්ඡා කිරීම තිබේනම් ඕනෑකම ඇතිවී වීර්යය ඇති වී

අප්‍රමාදය අප තුල ජීවත් වෙනව. ප්‍රමාදය නැති වෙනව. ප්‍රමාදය නැතිවෙන කොට සිතේ සන්සුන්කම ඇතිවෙනව.

අද මුළුමනින්ම මුළු ලෝකයම පැය 24 දීම කරන්නෙ වයසට තැනට කාලයට ගැලපුනත් නැතත් ඇස් කන් නාසාදිය පිනවමින් කාමයට ගරුකාර සත්කාර කිරීමයි. එවිට නොසන්සුන්කම ඇති වෙනව. නැවතිල්ලේ හිතන්න බැහැ. ගිනිගත් හිතකින් දුවනව. සමාධිය අතුරුදහන් වෙනව. එය ජීවමාන කල යුතුයි. බොහෝ බැරිනම් ටිකක්වත් පණ දිය යුතුයි. එවිට තමන්ගේ සිතට දැනෙනව තම ජීවිතය දිහා, විඳීම් දිහා, සිත දිහා, දහම දිහා නුවණින් බලන්න නුවණින් දකින්න හිතෙනවා සංවර කරගන්න හිතෙනවා එවිට ඉබේටම තම ජීවිතය තුල හික්මීම හෙවත් සිල්පද ජීවමාන වෙනව. එසේ තම සීලයෙහි අර්ථය තමන්ටම දැනෙන විට එසේ සිල්වත් වූ මහරහතන් වහන්සේලා වැනි උතුමන් සිහියට එනව. උන්වහන්සේලා විඳින ලද විමුක්ති සුවය කොයිතරම් දුරට පවතින්න ඇත්ද විඳින්න ඇත්ද කොතරම් සීලවන්තද කියලා සිතී ගරු සත්කාර දක්වන විට සංඝරත්නය තම සිතේ ජීවමාන වෙනව. එසේ තම සිත සංඝරත්නය පිළිබඳව විශ්වාස වන විට උන්වහන්සේලාට මගඵල ලැබීමට ඉවහල් වුන ධර්මයෙහි ස්වභාවය වැටහෙනවා. එහි යහපත් බව මේ ජීවිතයේදීම අවබෝධ කල හැකි බව කාලභේදයකින් තොරව ඵල ලැබෙන බව තම තමන් විසින් මෙනෙහි කල යුත්තක් බව අවංකවම ඕනෑම තරාතිරමක කෙනෙකුට අවබෝධ කල හැකි දහමක් බවට දැනෙනව. ධර්මය තමාතුල ජීව මාන වෙනවා.

එසේ දහම පිළිබඳ වැටහීම ඇති වන විට අප ගෞරව සත්කාර කරන්නේ ලොව කිසිවෙකුට පිහිටා නැති ලෙසට දැනගත යුතු යමක් ලොවේ ඇත්ද එය දැනගත් ("අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං) භාවිත කළ යුතු යමක් ලොවේ ඇත්ද එය භාවිත කළ ("භාවෙතබ්බං ච භාවිතං") දුරු කල යුතු යමක් ඇත්ද එය දුරු කල ("පහාතබ්බං පහීනංමේ") අසම සම ගුණයෙන් හෙබියාවූ ඒ උත්තමයා ලෙසට බුදුරජාණන් වහන්සේ අප සිත තුල ජීවමාන වෙනව. එසේ ජීවමාන වූ බුදුවරයෙකු පිළිබඳව මොහොතක් සිහිපත් කරයිද ගෞරව සිතින් දෑත එකතු කොට නමස්කාර කරයිද ජීවමාන බුදුවරයෙකුට දක්වන ලද ගෞරවයක ආනිසංස අප්‍රමාණව ඒකාන්තව ලැබෙනව. එවිට

මාරයාට කරන ලද ප්‍රකාශය කොයිතරම් සත්‍යද? හැමදාටම ගැලපෙනව නේද? යන්න ඔබටම දැනේවි.

සැරියුත් හාමුදුරුවන්ට වැටහුනා ශාස්තෲන් වහන්සේට ගෞරවයක් නැතිව එතනින් එහා ධර්මයට, සංඝරත්නයට, සීලයට, සමාධියට අප්‍රමාදයට, පිළිසඳරට කිසිවිටක ගෞරවයක් ඇති නොවන බව. ඒ වගේම තමයි යමෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි හරි අවබෝධයකින් අවංකව ඕනෑකමින් ගරු සත්කාර දක්වනවානම් ඉන් එහා ධර්මයට ආදී වශයෙන් ඉතිරි කරුණු හයටම ගරුකාර සත්කාර විශ්වාස ශ්‍රද්ධා ගොඩ නැගෙන බව. කුමක් සඳහාද? සියළු බුදුරජාණන් වහන්සේලාගේ අනුශාසනයට අනුව කටයුතු කිරීමෙන් එනම් අකුසල් දුරු කිරීමට, කුසල් වැඩීමට, සිත පිරිසිදු කිරීමට, සසර දුකින් එතෙර වීමටයි. මේ සිතිවිලි ධාරාව පහළ වූයේ ගෞතම ශාසනයේ අග්‍රශ්‍රාවක ධර්ම සේනාධිපති සැරියුත් මහ රහතන් වහන්සේ හුදකලාවම විමුක්ති සුව විඳිද්දී උන්වහන්සේගේ පිරිසිදු සන්තානයේය. මේ සූත්‍රය ඉගෙන ගන්නා අපට මීට පෙර අහන්න නොලැබුන දහමක් සැරියුත් හාමුදුරුවන්ගෙ සිතට පහළ වුනා බුදුරජාණන් වහන්සේ ඔප දමා අගය වැඩි කල සේක.

අප්‍රමාණ බුදු ගුණ අපේ මේ ජීවිත කාලෙදී අපිට දැන ඉගෙන ගෙන අවසන් කරන්න බැහැ. එනමුත් වත්මන් සමාජයේ බුදුගුණ කෙරෙහි සිත යොමු කරන මනුෂ්‍යයො අඩුයි. එවැනි දේකට බුද්ධ පූජාවකට යොමු වුනත් ඔවුන් බලන්නේ එහි ලෞකික ලාභයක්මයි. ශ්‍රමය ධනය වියදම් කරලා ශාස්තෲන් වන්සේට යමෙක් ගෞරව සත්කාර කරයි නම් ඔවුන්ට චෝදනා කරනව. දුප්පත් කෙනෙකුට ගෙයක් හදල දෙන්න ඒ ශ්‍රමය, ධනය වියදම් කරන්න යෝජනා කරනව. ඒ විදියට අප්‍රමාණ බුදු ගුණ අසරණයෙකුට හදන ගෙයකට සීමා කරන්න හදනව. අසරණ අයට පිහිට වෙන්න බුදු හිමියන්ද උගන්වනව. එනමුත් බුදුවරයෙකුට කරන සත්කාර ගරුකාර කරන්න උන්වහන්සේට තියන සුදුසුකම මේ තුන් ලෝක ධාතුවෙහිම වෙනත් කෙනෙකුගෙ ළඟ නැහැ. දුප්පත් කෙනෙකුගෙ ළඟ තියෙන්නේ දුප්පත්කම. බුදුවරයෙකු ලඟ තියෙන්නෙ "අරහං" ගුණය හෙවත් සුදුසුකමයි. ඒ ගුණය පමණක් සිතා කියා නිමකල නොහැකියි. එවැනි උත්තමයෙකුට ගරු කරන සත්කාර කරන කෙනෙකුට පමණයි ධර්මයට, සංඝයාට, සීලයට, සමාධියට, අප්‍රමාදයට, පිළිසඳරට ගෞරව සත්කාර කිරීමට සිතෙන්නෙ. එයින් ඔබට

**දැනෙන්න ඕනෙ එම උතුම් ලාභය ලබන්න බුදුවරයෙකුටම මිස වෙනත් කෙනෙකුට කළ ගෞරව සත්කාරයෙන් නොලැබෙන බව. එයින් ලැබෙන ලාභය වන්නේ අකුසල් දුරු කිරීමේ ලාභය සහ කුසල් වැඩීමේ ලාභයයි. ඒ බුද්ධ ශ්‍රාවකයෙකු සතු උතුම් හැකියාව බව අධිෂ්ඨාන කරගනිමු. එය ලෞකික සහ ලෝකෝත්තර සුවයේ උල්පත බව ඇස්පනාපිටම ඔබට දැනේවි.**